මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය
Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2020 මාර්තු

| වාපාර අධ්‍යනය I | 12 ශ්‍රේණිය | කාලය : පැය 02 යි |
|---|---|---|

උපදෙස් :- ♦ ප්‍රශ්න අංක 01 සිට 30 දක්වා වඩාත් සුදුසු පිළිතුරට අදාළ අංකය හිස්තැනෙහි ලියන්න.

01. ලොව පුරා විවිධ වර්ගයේ ව්‍යාපාර දැකිය හැකි නමුත් ඕනෑම ව්‍යාපාරයක පදනම වනුයේ,
    I. ක්‍රය ශක්තිය යි.
    ii. ප්‍රජාව යි.
    iii. වෙළෙඳපොල යි.
    iv. අවශ්‍යතා හා වුවමනා යි.
    v. ඉල්ලුම හා සැපයුම යි. ( )

02. ව්‍යාපාර විකාශනයේ විවිධ අවස්ථා හා බැඳුණු සුවිශේෂී සිදුවීම් පහත වගුවේ දක්වා ඇත.

| | අවස්ථා | | සිදුවීම් |
|---|---|---|---|
| 1. | භාණ්ඩ හුවමාරුව | A. | ගෝලීයකරණය ව්‍යාප්ත වීම. |
| 2. | මුදල් භාවිතය | B. | මහා පරිමාණ නිෂ්පාදනය |
| 3. | කාර්මික විප්ලවය | C. | වෙළඳාමේ ආරම්භය |
| 4. | තොරතුරු ආර්ථිකය | D. | උපකාරක සේවා හි ආරම්භය |

( )

ඉහත අවස්ථා හා සිදුවීම් නිවැරදිව ගැළ පූ විට පිළිතුර වනුයේ,

i. 1 - A, 2 - B, 3 - C, 4 - D
ii. 1 - C, 2 - D, 3 - B, 4 - A
iii. 1 - B, 2 - C, 3 - D, 4 - A
iv. 1 - C, 2 - A, 3 - B, 4 - D
v. 1 - D, 2 - C, 3 - A, 4 - B ( )

03. කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතයට අදාළ නිෂ්පාදිත කිහිපයක දායකත්වය පහත දැක්වේ.

| | | |
|---|---|---|
| A - | පතල් හා කැණීම් කර්මාන්තය | - 2.3% |
| B - | කිරි, බිත්තර, මස් හා සත්ත්ව නිෂ්පාදන | - 0.6% |
| C - | මලාප්‍රවාහන කටයුතු, කසල කළමණාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය | - 0.3% |
| D - | ජලය පිරිසිදු කිරීම හා බෙදා හැරීම | - 0.1% |
| E - | තොරතුරු හා සන්නිවේදන කටයුතු පිළිබඳ සේවාවන් | - 0.6% |

ඉහත ආර්ථික කටයුතු වලින් කර්මාන්ත අංශයට පමණක් අයත් වන්නේ මොනවාද?

i. A, B හා C  ii. C, D හා E  iii. A, C හා D
iv. B, D හා E  v. B, C හා D ( )

04. ව්‍යාපාර ආයතනයක් මුහුණපාන තර්ජන කීපයක් පහත වේ.
    A - නව තාක්ෂණික සොයා ගැනීම්
    B - ආදේශක භාණ්ඩ වෙළඳපොලේ බහුල වීම.
    C - ආනයන බදු ඉහල දැමීම.
    D - නව තරඟකරුවන් වෙළඳපොලට පිවිසීම්
    E - පුහුණු ශ්‍රමිකයන්ගේ හිඟය.

F - විභව ආයෝජකයන්ගේ වර්ධනය
G - සැපයුම්කරුවන්ගේ දැඩි කොන්දේසි

ඉහත කරුණු අතරින් ආසන්න පරිසරය තුලින් ඇතිවන තර්ජන පමණක් ඇතුලත් පිළිතුරු කාණ්ඩය වනුයේ,

| | | | | | |
|---|---|---|---|---|---|
| i. | B, D, F,G | iii. | A, B, C, D | v. | C, D, E, F |
| ii. | A, C, E, F | iv. | B,C, F, G | | ( ) |

05. සාර්ව පරිසර බලවේග කීපයක් x තීරුවේදී ඒ හා සම්බන්ධ නිදසුන් y තීරුවේද සඳහන්ය.

| | X | | Y |
|---|---|---|---|
| 1. | නෛතික පරිසරය | A. | අන්තර්ජාලය මඟින් සැපයෙන සේවා පුළුල් ලෙස වර්ධනය වේ |
| 2 | ආර්ථික පරිසරය | B. | ලෝකයේ රටවල් සමස්ථයක් වශයෙන් තිරසර සංවර්ධනයට යොමු වේ |
| 3. | තාක්ෂණික පරිසරය | C. | මෙම වසරේ පසුගිය වසරට වඩා දළ ජාතික නිෂ්පාදිතය ඉහල ගොස් ඇත. |
| 4. | ගෝලීය පරිසරය | D. | පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනත කඩකල වෙළෙඳුන් නීතියේ රැහැනට |
| 5. | දේශපාලන පරිසරය | E. | වතුසේවකයන්ගේ වැටුප් ප්‍රශ්නයට රජය ඍජුව මැදිහත් විය යුතු බව මන්ත්‍රීවරු ප්‍රකාශ කරයි. |

X තීරුවේ දැක්වෙන සාර්ව පරිසර බලවේග හා Y තීරුවේ නිදසුන් නිවැරදි ව අනුපිළිවෙලින් ගලපා ඇති පිළිතුරු තෝරන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| i. | 1 - E, | 2 - C, | 3 - A, | 4 - B, | 5 - D |
| ii. | 1 - B, | 2 - A, | 3 - C, | 4 - E, | 5 - D |
| iii. | 1 - A, | 2 - B, | 3 - E, | 4 - D, | 5 - C |
| iv. | 1 - D, | 2 - C, | 3 - A, | 4 - B, | 5 - E |
| v. | 1 - D, | 2 - C, | 3 - A, | 4 - E, | 5 - B ( ) |

06. පහත දැක්වෙන්නේ විවිධ පාර්ශව ව්‍යාපාර කෙරෙහි උනන්දු වීමට හේතු කිහිපයකි.
1. ප්‍රාග්ධනයේ සුරක්ෂිත භාවය
2. ණය වල සුරක්ෂිතභාවය
3. තනතුරේ වර්ධනය
4. ප්‍රසාද දීමනා

එම හේතු අදාල වන එක් එක් පාර්ශව පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
i. සේවකයන්, අයිතිකරුවන්, කළමණාකරුවන්, ණයහිමියන්
ii. අයිතිකරුවන්, සේවකයන්, ණයහිමියන්, කළමණාකරුවන්
iii. කළමණාකරුවන්, ණයහිමියන්, අයිතිකරුවන්, සේවකයන්
iv. අයිතිකරුවන්, ණයහිමියන්, කළමණාකරුවන්, සේවකයන්
v. අයිතිකරුවන්, ණයහිමියන්, කළමණාකරුවන්, ණයගැතියන් ( )

07. පහත සඳහන් වන්නේ සිද්ධි කිහිපයකි
A. පාරිභොගික ඉල්ලුම හා රුචිය වෙනස් වීම.
B. මඩවට අයත්ව තිබූ ඉඩම කමල්ට විකිණීම.
C. මීකිරි නිෂ්පාදකයෙකු කිරි හට්ටි සිල්ලර කඩවලට විකිණීම.
D. නයනා ගෙවත්තේ වවන එළවළු දිනපතා ආහාරයට ගැනීම.

මෙම සිද්ධි අතරින් ව්‍යාපාර ගති ලක්ෂන පිලිඹිබු වන සිද්ධි පමණක් ඇතුළත් වරණය තෝරන්න.

| | | | |
|---|---|---|---|
| i. A හා D | iii. A හා C | v. C හා D | |
| ii. B හා C | iv. B හා D | | ( ) |

08. සිය ව්‍යාපාර ක්‍රියාකාරකම් පිලිබඳවත් එමගින් සමාජයට ඇතිවන බලපෑම් පිළිබඳවත් පෞද්ගලිකවම වගකීම සමාජ වගකීමයි. මෙම නිර්වචනය ඉදිරිපත් කරන ලද්දේ,

I. මාලන් බේකර්
ii. පිලිප් කොට්ලර්
iii. පිලිපීනය
iv. ඇමරිකා එක්සත් ජනපදය
v. තිරසර සංවර්ධනය සඳහා වූ ලෝක ව්‍යාපාර කවුන්සිලය ( )

09. පහත දක්වෙන්නේ ව්‍යාපාර ආචාරධර්ම හා සමාජ වගකීම් වලට අදාල ප්‍රකාශ කිහිපයකි.

A. සේවක වෘත්තීය ආරක්ෂාව තහවුරු කිරීම
B. සාධාරණව හා අවංකව තරඟ කිරීම.
C. පාරිභෝගික ආරක්ෂාව හා අයිතිවාසිකම් තහවුරු කිරීම
D. අන් අයට හානි නොවන අයුරු කටයුතු කිරීම.

ඉහත ප්‍රකාශ අතුරින් ව්‍යාපාර ආචාරධර්ම වලට අදාල ප්‍රකාශ ඇතුලත් කාණ්ඩය තෝරන්න.

i. A හා B iii. C හා D v. D හා B
ii. B හා C iv. A හා C ( )

10. ව්‍යාපාර අචාර ධර්ම පද්ධතියක් ගොඩනැගීමේදී සැලකිලිමත් විය යුතු කරුණු පමණක් ඇතුලත් පිළිතුර වනුයේ,

i. ව්‍යාපාරය, සැපයුම්කරුවන්, ගණුදෙනුකරුවන්, කළමණාකරුවන්
ii. ගණුදෙනුකරුවන්, තරඟකරුවන්, සේවකයන්, ප්‍රායෝගික බව
iii. ව්‍යාපාරය, ගණුදෙනුකරුවන්, සැපයුම්කරුවන්, සමාජ සංස්කෘතිය
iv. සමාජ සංස්කෘතිය, සංවිධාන සංස්කෘතිය, ගණුදෙනුකරුවන්, සංවිධාන ව්‍යුහය
v. ව්‍යාපාරය, ගණුදෙනුකරුවන්, ඇල්මැති පාර්ශව, අයිතිකරුවන් ( )

11. පාරිභෝගික වගකීම් පමණක් ඇතුලත් පිළිතුර තෝරන්න.

I. ක්‍රියාකාරී සහභාගීත්වය, සමාජය ගැන සැලකිල්ල, පාරිසරික දැනුවත් බව, ආරක්ෂාව සලසා ගැනීම, තොරතුරු දැන ගැනීම.
ii. ක්‍රියාකාරී සහභාගීත්වය, සමාජය ගැන සැලකිල්ල, පාරිසරික දැනුවත්භාවය, ආරක්ෂාව සලසා ගැනීම, වන්දි ලබා ගැනීම.
iii. ක්‍රියාකාරී සහභාගීත්වය, සමාජය ගැන සැලකිල්ල, පාරිසරික දැනුවත්බව, තොරතුරු දැන ගැනීම, සවන් යොමු කරවා ගැනීම.
iv. ක්‍රියාකාරී සහභාගීත්වය, සමාජය ගැන සැලකිල්ල, පාරිසරික දැනුවත්භාවය, විචාරාත්මක දැනුවත් බව, සහයෝගීතාවය.
v. ක්‍රියාකාරී සහභාගීත්වය, සමාජය ගැන සැලකිල්ල, පාරිසරික දැනුවත්භාවය, විචාරාත්මක දැනුවත් බව, වන්දි ලබා ගැනීම. ( )

12. රජය ව්‍යාපාරවලට සහාය ලබා දීම සඳහා පිහිටුවා ඇති ආයතන කිහිපයක් සහ එම ආයතන සහාය ලබා දෙන ක්ෂේත්‍ර වලට නිදසුන් පහත දක්වේ.

| ආයතනය | | | සහාය ලබා දෙන ක්ෂේත්‍ර | |
|---|---|---|---|---|
| A | - | රක්ෂණ මණ්ඩලය | 1. | මූල්‍ය කටයුතු |
| B | - | ජාතික ව්‍යාපාර කළමණාකාරීත්වය | 2. | නියාමන කටයුතු |
| C | - | ලංකා විදුලි බල මණ්ඩලය | 3. | තොරතුරු සැපයීම |
| D | - | ජාතික සංවර්ධන බැංකුව | 4. | උපදෙස් හා පුහුණුව |
| E | - | ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව | 5. | යටිතල පහසුකම් කටයුතු |

එම ආයතන සපයන සේවා නිවැරදිව ගැලපූ විට පිළිතුර වනුයේ,

| | | | | | |
|---|---|---|---|---|---|
| i. | A - 2, | B - 4, | C - 5, | D - 3, | E - 1 |
| ii. | A - 2, | B - 4, | C - 3, | D - 5, | E - 1 |
| iii. | A - 2, | B - 4, | C - 5, | D - 1, | E - 3 |
| iv. | A - 2, | B - 4, | C - 1, | D - 5, | E - 3 |
| v. | A - 2, | B - 5, | C - 4, | D - 1, | E - 3 |

( )

13. රටේ මුදල් සැපයුම පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරයි. මේ සඳහා භාවිතා කරන ප්‍රධාන මූල්‍ය උපකරණ ඇතුලත් නිවැරදි පිළිතුර වනුයේ,
    i. විවට වෙළෙඳපොළ කටයුතු, ප්‍රතිපත්තිමය පොලී අනුපාත, ව්‍යවස්ථාපිත සංචිත, අනුපාත වෙනස් කිරීම, වට්ටම් අනුපාත වෙනස් කිරීම, ණය සීමා පැනවීම.
    ii. විවට වෙළෙඳපොළ කටයුතු, බැංකු පොලී අනුපාත වෙනස් කිරීම, ව්‍යවස්ථාපිත සංචිත අනුපාත වෙනස් කිරීම, වටුටම් අනුපාත නීර්ණය කිරීම, ණය සීමා පැනවීම.
    ii. විවට වෙළෙඳපොළ ප්‍රතිපත්තමය පොලී අනුපාත, ව්‍යවස්ථාපිත සංචිත අනුපාත වෙනස් කිරීම, වට්ටම් අනුපාත වෙනස් කිරීම, ව්‍යවස්ථාපිත සංචිත අුපාත, වෙනස් කිරීම, ගුණාත්මක ණය සීමා පැනවීම.
    iv. විවිට වෙළඳපොළ කටයුතු, බැංකු පොලී අනුපාත වෙනස් කිරීම, ව්‍යවස්ථාපිත සංචිත අනුපාත වෙනස් කිරීම, වට්ටම් අනුපාත තීරණය කිරීම, ණය සීමා පැනවීම.
    v. විවට වෙළෙඳ පොළ කටයුතු, නිත්‍ය ණය පහසුකම් අනුපාතය වට්ටම් අනුපාත වෙනස් කිරීම, ණය සීමා පැනවීම, ව්‍යවස්ථාපිත සංචිත අනුපාත වෙනස් කිරීම.

( )

14. පහත සඳහන් වන්නේ රජයේ ආර්ථික අරමුණු කිහිපයක් හා ඒවා ඉටුකර ගැනීමට ව්‍යාපාරික ප්‍රජාවට දායක විය හැකි ආකාරයන්ය.

A - ආර්ථික ස්ථායිතාවය
B - පූර්ණ සේවා නියුක්තිය
C - බදු ගෙවීම
D - දේශීය සම්පත් භාවිතය
E - යහපත් අන්තර් ජාතික වෙළෙඳාම
F - රජයේ ප්‍රතිපත්ති පිළි පැදීම

ඉහත කරුණු අතරින් රජයේ ආර්ථික අරමුණු ඉටුකර කර ගැනීමට ව්‍යාපාරික ප්‍රජාවට දායක විය හැකි ආකාර ගණන

i. 1 කි ii. 2 කි iii. 3 කි iv. 4 කි v. 5 කි

( )

15. පහත සඳහන් පිළිතුරු අතරින් ඍජු බදු පමණක් ඇතුළත් වන වරණය වනුයේ,
    I. රඳවා ගැනීමේ බදු පුද්ගල ආදායම් බදු, රේගු බදු, නිෂ්පාදන බදු
    ii. පුද්ගල ආදායම් බදු, පොලී මත බදු, ආනයන බදු, තීරු බදු
    iii. රඳවා ගැනීමේ බදු, රේගු බදු, සමාගම් බදු, පොලී මත බදු
    iv. රඳවා ගැනීමේ බදු, එකතු කළ අගය මත බදු, ආනයන බදු, සමාගම් බදු
    v. පුද්ගල ආදායම් බදු, පොලී මත බදු, සමාගම් ලාභ බදු, ප්‍රාග්ධන බදු ( )

16. පහත දක්වෙන්නේ සංස්ථාපිත සමාගම් වලට අදාල ලක්ෂණ කිහිපයකි.

A - අවම වශයෙන් අධ්‍යක්ෂකවරු දෙදෙනෙකුවත් සිටිය යුතු වීම.
B - සමාගමේ කොටස් ප්‍රසිද්ධියේ විකිණිය නොහැකි වීම.
C - සමාගමේ කොටස් කොළඹ කොටස් වෙළෙඳපොල තුල ලේඛන ගත කළ හැකි වීම.
D - ලාභාංශ ගෙවීමට පෙර ණය ගෙවීමේ හැකියාව පරීක්ෂා කළ යුතුය.
E - අවම අධ්‍යක්ෂකවරු සංඛ්‍යාව එකකි.

ඉහත ලක්ෂණ වලින් සීමාසහිත පුද්ගලික සමාගම් වලට පමණක් අදාල වන කරුණු ඇතුලත් පිළිතුර වනුයේ,

i. A, B, C, ii. B, D, E iii. A, B, D iv. B, C, E v. C, D, E ( )

17. Mc Donalds (මැක්ඩොනල්ඩ්ස්) - සී/ස අබාන්ස් රෙස්ටුරන්ට් (පුද්ගලික) සමාගම
ඉහත නම් අතර ඇති ව්‍යාපාර සම්බන්ධතාවය වනුයේ,

I. හවුල් ව්‍යාපාරයකි
ii. වරලත් ව්‍යාපාරයකි
iii. විදේශ සමාගමකි
iv. ව්‍යාපාර ඒකාබද්ධ වීමකි
v. ව්‍යාපාර සංයෝජනයන්ය ( )

18. පහත දැක්වෙන්නේ ව්‍යාපාර සංවිධාන වර්ග වලට අයත් ලක්ෂණ කිහිපයකි.

A - බොහෝ දුරට සේවා සැපයීමේ නිරත ආයතන වීම.
B - විශේෂ හෝ පොදු පනතක් මගින් සංස්ථාපනය වීම.
C - වාර්ෂික අයවැය ලේඛනය මගින් අවශ්‍ය අරමුදල් ප්‍රතිපාදන ලබා ගැනීම.
D - මුළු ප්‍රාග්ධනයෙන් 51%කට නොවැඩි ප්‍රමාණයන් රජය සතු වීම.
E - සභාපතිවරයෙකු යටතේ පාලනය වීම.
F - අමාත්‍යාංශයක් යටතේ සෘජුව පාලනය වීම.
G - භාණ්ඩ හා සේවා අලවියෙන් අරමුදල් සම්පාදනය කර ගැනීම.

ඉහත කරුණු වලින් රාජ්‍ය දෙපාර්තුමේන්තුවකට අයත් ලක්න පමණක් ඇතුලත් පිළිතුර වනුයේ,

i. A, C, D, F
ii. A, C, D, E
iii. A, C, D, F, G
iv. A, B, C, F
v. A, C, F, ( )

19. සමුපකාර සමිතියක් ලියා පදිංචි කිරීමට සමුපකාර සංවර්ධන කොමසාරිස් වෙත ඉදිරිපත් කල යුතු ලියවිලි වලට අයත් නොවන ලියවිලි දැක්වෙන පිළිතුර වනුයේ,

A - අතුරු ව්‍යවස්ථාවේ පිටපත්
B - සාමාජික මුදල් පරිහරණය හා භාරකාරීත්වය පිළිබඳ වාර්තාව
C - සාංගමික ව්‍යවස්ථාවලියේ පිටපතක්
D - අධ්‍යක්ෂක වරුන්ගේ කැමැත්ත දැක්වෙන ලිපියක්
E - සමිතිය පිහිටි ස්ථානයට ලඟා විය හැකි දළ සිතියමක්.

i. A, E ii. A, B iii. C, D iv. A, D v. C, E ( )

20. සංස්ථාපිත සමාගමක සීමාසහිත වගකීම යනුවෙන් අදහස් කරන්නේ,

i. කොටස් හිමියන්ගේ ඡන්ද බලය සීමිත වාර ගණනකට යටත් වීමයි.
ii. කොටස්කරුවන් සංඛ්‍යාව උපරිම ගණනකට සීමා වීමයි .
iii. කොටස්කරුවන්ට කොටස් මිළදී ගැනීමට ඇති හැකියාව සීමා වීමයි.
iv. කොටස්කරුවන්ගේ බාහිර ණය තුරුස් සඳහා පියවීමට ඇති බැඳීම තමා ආයෝජනය කල කොටස් වල අගයට සීමා වීමයි.
v. තමාට අවශ්‍ය විටදී තමාගේ කොටස් වෙනත් අයෙකුට පැවරීමට සමාගම් පනතෙන් සීමා පනවා තිබීමයි.

21. ව්‍යාපාර සංවිධාන වර්ග කිහිපයක් හා ඒවාට අදාල කරුණු කිහිපයක් පහත වගුවේ දක්වා ඇත.

| ව්‍යාපාර සංවිධාන වර්ගය | අදාල කරුණු |
|---|---|
| 1. සීමා සහිත පොදු සමාගම් | A - රජයේ සෘජු පාලනයට යටත් වේ. |
| 2. හවුල් ව්‍යාපාර | B - එක් සාමාජිකයෙකුට හිමි වන්නේ එක් ඡන්දයක් පමණි. |
| 3. රාජ්‍ය සංස්ථා | C - 1918 අංක 6 දරණ ව්‍යාපාර නාම ආඥා පනත |
| 4. රාජ්‍ය දෙපාර්තුමේන්තුව | D - විශේෂ හෝ පොදු පාර්ලිමේන්තු පනතක් මගින් සංස්ථාපනය කෙරේ. |
| 5. සමූපාකාර සමිති | E - සෑම සාමාජිකයෙකුටම ඔහු දරණ කොටස් ප්‍රමාණය අනුව ඡන්ද බලය හිමි වේ. |

ව්‍යාපාර සංවිධාන වර්ගය හා අදාල කරුණු නිවැරදිව ගලපා ඇති පිළිතුරු තෝරන්න.

i. 1 - E, 2 - C, 3 - D, 4 - A, 5 - B
ii. 1 - B, 2 - C, 3 - A, 4 - D, 5 - E
iii. 1 - C, 2 - B, 3 - A, 4 - D, 5 - E
iv. 1 - B, 2 - C, 3 - A, 4 - E, 5 - D
v. 1 - E, 2 - C, 3 - A, 4 - D, 5 - E

( )

22. ව්‍යවසායකත්වය තුලින් අත්වන ප්‍රතිලාභ පහත දැක් වේ.

| | |
|---|---|
| 1. පුද්ගල ප්‍රතිලාභ | A - තරඟකාරීත්වයට මුහුණ දීමට පහසු වීම. |
| 2. ආයතනික ප්‍රතිලාභ | B - නව රැකියා අවස්ථා උත්පාදනය වීම. |
| 3. සමාජ හා ආර්ථික ප්‍රතිලාභ | C - පෞද්ගලික මූල්‍යමය ලාභ ලැබීම. |
| | D - ව්‍යාපාර කටයුතු පුළුල් වීම. |
| | E - ජනතාවගේ ජීවන මට්ටම් ඉහළ යාම. |
| | F - ආත්ම තෘප්තිය ලැබීම. |

පුද්ගල, ආයතනික හා සමාජ හා ආර්ථික ප්‍රතිලාභ පිළිවෙලින් ගැලපූ විට නිවැරදි පිළිතුරු වනුයේ,

i. 1 C, D 2 A, F 3 B, E
ii. 1 C, F 2 A, D 3 B, E
iii. 1 A, B 2 C, D 3 E, F
iv. 1 A, D 2 B, E 3 C, F
v. 1 B, E 2 C, F 3 A, D

( )

23. ව්‍යවසායකයකු වීම සඳහා ඔහු තුල පැවතිය යුතු ගති ලක්ෂණ හා කුසලතා රාශියක් ඇත. එයින් ව්‍යවසායක ගති ලක්ෂණ පමණක් ඇතුලත් පිළිතුරු තෝරන්න.

I. නායකත්වය, කැපවීම, ආත්ම විශ්වාසය, සන්නිවේදන හැකියාව
ii. නායකත්වය, කැපවීම, ආත්ම විශ්වාසය, නිර්මාණශීලී බව
iii. අවදානම් කළමනාකරණ හැකියාව, නායකත්වය, නිර්මාණශීලී බව, සන්නිවේදන හැකියාව
iv. නිර්මාණශීලී බව, අවදානම් කළමනාකරණ හැකියාව, කැපවීම, ස්වාධීන බව
v. සන්නිවේදන හැකියාව, ස්වාධීන බව, කැපවීම, ආත්ම විශ්වාසය

( )

24. අඩු ආදායම් ලාභීන් සඳහා 'කණ්ඩායම් ණය ක්‍රමය' හඳුන්වා දී ඔවුන්ගේ ආයෝජනය දිරිමත් කර ජීවන තත්ත්වය උසස් කිරීමට දායක වීම තුලින් ලෝකය යහපත් ස්ථානයක් බවට පත් කිරීම.
   i. අභ්‍යන්තර ව්‍යවසායකත්වයය.
   ii. කාන්තා ව්‍යවසායකත්වයය.
   iii. ගෝලීය ව්‍යවසායකත්වය
   iv. සමාජයීය ව්‍යවසායකත්වයය.
   v. හරිත ව්‍යවසායකත්වයය. ( )

25. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හඳුනා ගැනීම සඳහා යොදා ගැනෙන ප්‍රමාණාත්මක නිර්ණායන නිවැරදිව දක්වෙන පිළිතුර වනුයේ,
   i. සේවක සංඛ්‍යාව, ප්‍රාග්ධනය, ව්‍යාපාර සංවිධාන වර්ගය
   ii. වගකීම, ආයෝජිත ප්‍රාග්ධනය, ව්‍යාපාර සංවිධාන වර්ගය
   iii. ආයෝජිත ප්‍රාග්ධනය, වාර්ෂික පිරිවැටුම, ව්‍යාපාර සංවිධාන වර්ගය
   iv. සේවක සංඛ්‍යාව, වාර්ෂික පිරිවැටුම. වගකීම
   v. ආයෝජිත ප්‍රාග්ධනය, සේවක සංඛ්‍යාව, භාවිතා කරන බලශක්තිය මත ( )

26. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිරිගැන්වීම යටතේ කාන්තා ක්ෂුද්‍ර ව්‍යවසාය ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය (ලිය ඉසුර) සඳහා කාරක ප්‍රාග්ධනය සපයනු ලබන්නේ,
   i. සමූපාකාර ග්‍රාමීය බැංකු විසිනි.
   ii. ලංකා බැංකුව විසිනි.
   iii. සමෘද්ධි බැංකු / දිවි නැගුම බැංකු විසිනි.
   iv. ස. ණ. ෂ. බැංකුව විසිනි.
   v. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසිනි. ( )

27. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිරිගැන්වීම යටතේ එම දිරිගැන්වීම ලබා දෙන ආයතන හා සපයනු ලබන දිරිගැන්වීම පහත දක් වේ.

| | දිරිගැන්වීම ලබා දෙන ආයතන | | දිරිගැන්වීම |
|---|---|---|---|
| A | - කාර්මික තාක්ෂණ ආයතන | 1. | අලෙවි පහසුකම් |
| B | - අපනයන සංවර්ධන මණ්ඩලය | 2. | උපදේශන සේවා |
| C | - ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය | 3. | මූල්‍යමය පහසුකම් |

එම දිරිගැන්වීම් ලබා දෙන ආයතන හා දිරිගැන්වීම් වර්ගය නිවැරදිව ගැලපූ විට පිළිතුර නිවැරදිව දක්වනුයේ,
   i. A - 2, B - 1, C - 3,
   ii. A - 1, B - 3, C - 2,
   iii. A - 3, B - 2, C - 1,
   iv. A - 1, B - 2, C - 3,
   v. A - 3, B - 1, C - 2, ( )

28. පහත X තීරුවෙන් ප්‍රධාන මූල්‍ය ආයතන වර්ගයද Y තීරුවෙන් මූල්‍ය ආයතන කිහිපයක නම් ද දක් වේ.

| X | | Y | |
|---|---|---|---|
| 1. | බලපත්‍රලාභී වාණිජ බැංකුවකි. | A | - ජේ. බී. සෙකියුරිටීස් (පුද්) සමාගම |
| 2. | බලපත්‍රලාභී විශේෂිත බැංකුවකි. | B | - ලංකා වෙන්චර්ස් ලිමිටඩ් |
| 3. | විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමකි. | C | - ජාතික සංවර්ධන බැංකුව |
| 4. | කොටස් තැරව්කාර සමාගමකි | D | - රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව |
| 5. | ව්‍යවසායකත්ව ප්‍රාග්ධන සමාගමකි. | E | - එස්. එම්. බී. ලීසිං පී. එල්. සී |

ඉහත X හා Y ගැලපූ විට නිවැරදි පිළිතුර වනුයේ,

| | | | | | |
|---|---|---|---|---|---|
| i. | 1 - A, | 2 - B, | 3 - C, | 4 - D, | 5 - E |
| ii. | 1 - C, | 2 - D, | 3 - E, | 4 - A, | 5 - B |
| iii. | 1 - B, | 2 - C, | 3 - A, | 4 - D, | 5 - E |
| iv. | 1 - D, | 2 - E, | 3 - C, | 4 - A, | 5 - B |
| v. | 1 - C, | 2 - D, | 3 - A, | 4 - B | 5 - E |

( )

29. බලපත්‍රලාභී බැංකුවක් යම් හේතුවක් මත බිඳ වැටෙන අවස්ථාවකදී එක් තැන්පත් කරුවෙකුට එක් බැංකුවක් සඳහා රු. ලක්ෂ 6ක උපරිම සීමාවකට යටත්ව මුදලක් ගෙවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව පිහිටුවා ඇති අරමුදල වන්නේ,

I. ජාතික රක්ෂණ භාර අරමුදල
ii. තැන්පතු හිමියන්ගේ වන්දි අරමුදල
iii. ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය
iv. සේවක අර්ථ සාධක සහ තැන්පතු රක්ෂණ
v. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් වන්දි අරමුදල ( )

30. මුදලක කාර්යයන් ලෙස සැලකිය නොහැක්කේ

I. සහල් කිලෝවක මිල රු. 98 ක් ලෙස මිළ කිරීම.
ii. රු. 100 000ක මුදලක් ස්ථාවර තැන්පත් ගිණුමක තැන්පත් කිරීම.
iii. රු. 1000ක මුදල රු. 500, රු. 100, රු. 50, නෝට්ටු වලට මාරු කිරීම.
iv. රු. 20000ක ජංගම දුරකථනයක් මිළදී ගැනීම.
v. අවුරුදු 2කින් ගෙවා නිම කිරීමට බැංකු ණය ගැනීම. ( )

**ප්‍රශ්න අංක 31 සිට 40 දක්වා ප්‍රශ්නවලට සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

31. අ. කිසියම් පුද්ගලයකු තමා වඩාත් දක්ෂ කාර්යයේ පමණක් යෙදී ලබන නිපුණතාව.......................................... වන අතර එයට පදනම වූයේ .......................................... යි.

ආ. .......................................... හා..........................................ලෙස ව්‍යාපාරයක ප්‍රධාන කටයුතු දෙයාකාර වේ.

32. අ. රූපවාහිනී තාක්ෂණය භාවිතයෙන් බැංකු කටයුතු සිදු කිරීම .......................................... වන අතර දුරකථනය භාවිතයෙන් බැංකු කටයුතු සිදු කිරීම .......................................... වේ.

ආ. ව්‍යාපාර කටයුතු හා සම්බන්ධ වූ .......................................... පවත්වා ගෙන යාම හා..........................................කටයුතු පවත්වාගෙන යාම පරිපාලන කාර්යයට අයත් වේ.

33. අ. අඩු වටිනාකමක් ඇති .......................................... වැඩි වටිනාකමක් ඇති .......................................... බවට පත් කිරීම ප්‍රතිචක්‍රීයකරණයේ එක් අදියරකි.

ආ. ව්‍යාපාරය සඳහා සකස් කරන ආචාර ධර්ම ලිඛිතව දක්වූ විට එය .......................................... ලෙස හඳුන්වයි

34. අ. අභ්‍යන්තර මිල ස්ථායීතාව තුළින් .......................................... හා .......................................... පාලනය කිරීම සිදු කෙරෙයි.

ආ. බාහිර මිල ස්ථායීතාව තුළින් .......................................... අනුපාතය .......................................... මට්ටමක පවත්වා ගැනීම සිදු කෙරේ.

35. අ. වරලත් ව්‍යාපාරයක වරලත් හිමියා සහ වරලත් ලාභියා අතර ඇතිවන එකඟතාවය ...................................... .......................................... ලෙස හැඳින්වෙන අතර වරලත් හිමියාගේ වෙළෙඳ ලකුණ සහිත භාණ්ඩ ඔහුගෙන් මිලට ගෙන නැවත විකිණීමට අයිතිය ලැබෙන ව්‍යාපාර. .................................. ............................. ලෙස හඳුන්වයි.

ආ. හවුල්කරුවන්ගේ සම්පූර්ණ නමින් හැර වෙනත් නමකින් පවත්වාගෙන යන හවුල් ව්‍යාපාරයක් ලියාපදිංචි කල යුත්තේ .......................................... යටතේය. ඒ සඳහා යා යුත්තේ.................................................. වෙතටය.

36. අ. සේවා සැපයීම අරමුණු කරගත් ව්‍යාපාරයේ නමට .......................................... නොමැති පූර්ණ අයිතිය රජය ෂතු වන ව්‍යාපාර සංවිධාන වර්ගය .......................................... වේ.

ආ. අදාල රටේ සමාගමක් ලෙස සංස්ථාපනය කර .......................................... ලියාපදිංචි වී එම රටින් පිටත ව්‍යාපාර කරන සමාගම් .......................................... ලෙස හඳුන්වයි.

37. අ. .......................................... .......................................... පරිසරය සුරැකීම ඔවුන්ගේ හර සංකල්පය ලෙස සලකයි. මෙම ව්‍යවසායකයන්ගේ ව්‍යාපාර කටයුතු වලින් .......................................... .......................................... ධනාත්මක බලපෑම් ඇති කරයි.

ආ. සියළු ව්‍යවසාය .......................................... වන අතර සියළු ව්‍යාපාර .......................................... නොවේ.

38. අ. කුඩා ව්‍යාපාරයක් හඳුනා ගැනීමට ස්ථිර සේවක සංඛ්‍යාව නිර්ණායනය වශයෙන් යොදා ගන්නා ආයතනය වන්නේ .......................................... වේ.

ආ. ව්‍යවසායකත්වයේ අවසාන ප්‍රතිඵලය .......................................... වේ.

39. අ. රජයේ සුරැකුම්පත් ප්‍රථම වතාවට අලෙවි කොට මුදල් ලබා ගන්නා වෙළෙඳ පොල.......................................... වන අතර මෙම වෙළඳ පොළට සහභාගී වීම සඳහා .......................................... අවසර ලබා ගත යුතුය.

40. සංස්ථාපිත සමාගම් වල කොටස් හා ණයකර විකිණීම හා මිලට ගැනීම සම්බන්ධ කටයුතු කරන ආයතන .......................................... .......................................... .......................................... වන අතර ඔවුන් ව්‍යාපාරික කටයුතු කිරීම සඳහා .......................................... .......................................... .......................................... බලපත්‍රයක් ලබා ගත යුතුය.

**41 - 50 දක්වා ප්‍රශ්න වලට නිශ්චිත පිළිතුරු සපයන්න.**

41. ව්‍යාපාර විකාශනයේ වැදගත් අවස්ථා 04 නම් කරන්න.

1.......................................................................... 2..........................................................................

3.......................................................................... 4..........................................................................

42. ආර්ථිකයේ පැවැත්මට ව්‍යාපාර දායක වන ආකාර 4ක් දක්වන්න.

1.......................................................................... 2..........................................................................

3.......................................................................... 4..........................................................................

43. විද්‍යුත් වාණිජ්‍ය වර්තමානයේ ප්‍රචලිත වීමට බලපෑ හේතු 4ක් සඳහන් කරන්න

1.......................................................................... 2..........................................................................

3.......................................................................... 4..........................................................................

44. ගෝලීය පරිසරයේ උප සාධක 4ක් නම් කරන්න.

1.................................................................... 2....................................................................

3.................................................................... 4....................................................................

45. සමාජීයය වගකීම් ඉටු කිරීමෙන් ව්‍යාපාරයනට අත්වන ප්‍රතිලාභ 4ක් දක්වන්න.

1.................................................................... 2....................................................................

3.................................................................... 4....................................................................

46. හවුල් ව්‍යාපාරයක අනිවාර්යයෙන්ම තිබිය යුතු ලක්ෂණ 4ක් දක්වන්න.

1.................................................................... 2....................................................................

3.................................................................... 4....................................................................

47. ව්‍යාපාර සංයෝජන ව්‍යාපාර ක්ෂේත්‍රයේ නව ප්‍රවනතාවයක් වන අතර ඒකාබද්ධ වීමෙන් හෝ අත්පත් කර ගැනීමෙන් සිදුවන සංයෝජන ප්‍රධාන ආකාර 3ක සිදු වේ. ඒවා නම්,

1.................................................................... 2....................................................................

3....................................................................

48. ශ්‍රී ලංකාව තුල සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අසාර්ථක වීමට බල පා ඇති හේතු 4ක් වන්නේ

1.................................................................... 2....................................................................

3.................................................................... 4....................................................................

49. බලපත්‍රලාභී බැංකු යටතට අයත් වන වාණිජ බැංකු 2 කවරේද?

1.................................................................... 2....................................................................

50. බලපත්‍ර ලාභී වාණිජ බැංකු විසින් සපයන ප්‍රධාන සේවාවන් 2 නම් කරන්න.

1........................................................................................................................................

2........................................................................................................................................

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය
Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone
மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்
මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය
Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2020 මාර්තු

| වයාපාර අධ්‍යයනය II | 12 ශ්‍රේණිය | කාලය : පැය 03 යි |
|---|---|---|

උපදෙස් :-
- ♦ අවම වශයෙන් එක් කොටසකින් ප්‍රශ්න 2 බැගින්වත් තෝරා ගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

## I කොටස

01. උපුලි විසින් තම නිවසේ රන් පා නමින් පාවහන් සැකසීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. ඇය සෑම සතියකම ප්‍රදේශයේ සතිපොළට ගෙන ගොස් තම නිෂ්පාදිත අලෙවි කරයි. ඇයගේ සොහොයුරා වන මලිත් පාසල ආසන්නයේ මලිත් කමියුනිකේෂන් නමින් දුරකථන සේවා සපයනු ලබන ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. ඔහු ඒ අතරම තම සොහොයුරියගේ නිෂ්පාදිත ප්‍රවාහනය සඳහා ද උදව් කරයි. ඔහු ඒ වෙනුවෙන් කිසිදු ගාස්තුවක් අය නොකරයි.

i. මෙම සිද්ධියෙන් නිදසුන් දක්වමින් පහත සංකල්ප පැහැදිලි කරන්න.
   අ. ද්විතියික නිෂ්පාදන
   ආ. තෘතියික නිෂ්පාදන (ල. 4)

ii. අ. වක්‍ර නිෂ්පාදනය හඳුන්වා මෙහි සඳහන් නිදසුන් දෙකක් දක්වන්න. (ල. 2)
   ආ. ව්‍යාපාර වර්ධනය සඳහා උපකාර වන සේවා 2 ක් දක්වන්න. (ල. 2)

iii. උපුලිගේ ව්‍යාපාරයේ යෙදවුම් නිමවුම් ක්‍රියාවලිය රූප සටහනක් මඟින් පෙන්වන්න. (ල. 4)

iv. අ. මලිත් කමියුනිකේෂන් සඳහා ඇල්මැති පාර්ශව 4 ක් සඳහන් කරන්න. (ල. 2)
   ආ. ඉන් ඇල්මැති පාර්ශව 2 ක් එම ව්‍යාපාරයට ඇල්ම දැක්වීමට හේතු 2 බැගින් ලියන්න. (ල. 2)

v. අ. ''රජය විසින් සන්නිවේදන කටයුතු මත පනවා තිබූ බදු අහෝසි කරන ලදී.''
   මෙම වගන්තියෙන් ගම්‍ය වන ව්‍යාපාර පරිසර බලවේග සඳහන් කරන්න. (ල. 2)
   ආ. මෙසේ සන්නිවේදන කටයුතු සඳහා බදු ඉවත් කිරීම මලිත්ගේ ව්‍යාපාරයට බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ල. 2)

02. i. ''කසල බැහැර කිරීමට ඉඩ පහසුකම් නොමැති වීම නාගරික ජනතාව මුහුණ දෙන උග්‍රතම ගැටළුවකි.''
   අ. පාරිභෝගිකයන ලෙස කසල කළමනාකරණයට ඔබට දායක විය හැකි ආකාර 4 ක් සඳහන් කරන්න. (ල. 2)
   ආ. වර්තමානයේ ව්‍යාපාර සමාජ වගකීම ඉටු කිරීම කෙරෙහි වැඩි උනන්දුවක් දක්වයි.
   ව්‍යාපාර විසින් සේවකයන්ට සමාජ වගකීම ඉටු කරන ආකාර 4 ක් පැහැදිලි කරන්න. (ල. 2)

ii. අ. ව්‍යාපාර ආචාර ධර්ම යනුවෙන් කුමක් අදහස් වේ ද? (ල. 2)
   ආ. ව්‍යාපාර ආචාර ධර්ම පිළිපැදීම ව්‍යාපාරවලට වැදගත් වන්නේ කෙසේදැයි කරුණු 2 ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 2)

iii. ව්‍යාපාරයකට පාරිසරික තිරසර බව තහවුරු කිරීමට කළ හැකි ක්‍රියාකාරකම් 4 ක් දක්වන්න. (ල. 4)

iv. අ. රජයේ ආර්ථික අරමුණු ඉටු කිරීමට ව්‍යාපාර විවිධාකාරයෙන් දායක වේ. එසේ දායක වන ආකාර 4 ක් සඳහන් කරන්න. (ල. 2)
   ආ. ''ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආදායමට බදු නොවන ආදායම් වලින් ද සැලකිය යුතු ප්‍රමාණයක් දායක වේ.''
   බදු නොවන ආදායම් වර්ග 4 ක් සඳහන් කරන්න. (ල. 2)

v. පාරිභෝගික ආරක්ෂණය අතීතයට සාපේක්ෂව වර්තමානයේ වඩාත් වැදගත් වීමට හේතු 4 ක් සඳහන් කරන්න. (ල. 4)

03. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනු ලබයි. මෑත කාලීනව මහ බැංකුව විසින් ණය සඳහා අය කරන ලද පොලී අනුපාතය පහත දමන ලදී.

i. ණය සඳහා අය කරන ලද පොලී අනුපාතය අඩු කිරීම ව්‍යාපාර සඳහා බලපෑම් කරන ආකාරය පැහැදිලි කරන්න. (ල. 4)

ii. අ. ශ්‍රී ලංකාවේ. පාරිභෝගික ආරක්ෂණය සඳහා කටයුතු කරන රාජ්‍ය ආයතන 4 ක් දක්වන්න. (ල. 2)

ආ. පාරිභෝගික ආරක්‍ෂණය පාරිභෝගිකයාට වැදගත් වන ආකාර 4 ක් ලියන්න. (ල. 2)

iii. ''නිරන්තරයෙන් අවදානම් වලට මුහුණ දීම. ව්‍යාපාරයක ලක්ෂණයකි''
ව්‍යාපාරයක් විසින් මුහුණ දෙනු ලබන අවදානම් 4ක් සඳහන් කරන්න.

iv. අ. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ව්‍යාපාර සංවර්ධනය සඳහා කටයුතු කරන ආකාර 4 ක් සඳහන් කරන්න. (ල. 2)

ආ. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අරමුණු 2 ක් දක්වන්න. (ල. 2)

v. පහත සංකල්ප පැහැදිලි කරන්න.

අ. නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය

ආ. නිත්‍ය ණය පහසුකම් අනුපාතය (ල. 4)

04. නිහාල් පෙරේරා මහතා තමා විසින්ම යෝගට් අයිස් පැකට්, පළතුරු බීම නිපදවා අලෙවි කිරීමේ වෙළඳ සලක් මතුගම නගරයේ සුමිහිරි ප්‍රඩක්ට්ස් නමින් පවත්වාගෙන යයි.

i. අ. මෙම ව්‍යාපාරය අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද? (ල. 2)

ආ. එම ව්‍යාපාරය ලියා පදිංචි කිරීමට අදාල නීතිමය තත්ත්වය හා අදාල වන පනත කුමක් ද? (ල. 2)

ii. අ. මෙම ව්‍යාපාරයට නිහාල් පෙරේරා මහතාට තනිව අයිතිය තබාගෙන සිටින පෞද්ගලික සමාගමක් බවට පත් කල හැකි බව දියණිය පවසයි. එසේ සීමා සහිත පෞද්ගලික සමාගමක් බවට පත්කල විට එම සමාගම් වර්ගයට අදාල වන ලක්ෂණ 4 ක් දක්වන්න. (ල. 2)

ආ. සීමා සහිත පෞද්ගලික සමාගමක් ලියා පදිංචියට අදාල වන පනත හා ඒ සඳහා යා යුත්තේ කිනම් ආයතනයට ද? (ල. 2)

iii. අ. සීමා සහිත පොදු සමාගම් වල ආයෝජනය කිරීමට ආයෝජකයන් විශාල කැමැත්තක් දක්වයි. එවැනි පොදු සමාගම් වල ලක්ෂණ 4 ක් දක්වන්න. (ල. 2)

ආ. පොදු සමාගමක් ලියා පදිංචියට ඉදිරිපත් කිරීමේ දී ඒ සඳහා ඉදිරිපත් කල යුතු ලියවිලි 5 ක් නම් කරන්න. (ල. 2)

iv. අ. සමුපකාර ව්‍යාපාරයේ දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණ 4 ක් දක්වන්න. (ල. 2)

ආ. ඔබ ප්‍රදේශයේ සීමා සහිත විවිධ සේවා සමුපකාර සමිතියේ සභාපතිවරයා ඔබ යයි සිතා සමිතියේ වර්ධනයටත් උන්නතියටත් අදට ගැලපෙන ලෙසට ලාභය වර්ධනය කර ගැනීමටත් ඔබ යෝජනා කරන ක්‍රියා පිළිවෙලින් 4 ක් දක්වන්න. (ල. 2)

v. අ. රාජ්‍ය අංශය විසින් ව්‍යාපාර කටයුතු කරගෙන යාමට හේතු 4 ක් දක්වන්න. (ල. 2)

ආ. රාජ්‍ය සමාගමක ලක්ෂණ දෙකක් දක්වා රාජ්‍ය සමාගම් සඳහා නිදසුන් 2 ක් දක්වන්න. (ල. 2)

## II කොටස

05. i. අ. ''රටක ආර්ථික සංවර්ධනයේ නියමුවා ව්‍යවසායකයාය.''
ව්‍යවසායකයන් බිහිවීමට පසුබිම වන සාධක 4 ක් සඳහන් කරන්න. (ල. 2)

ආ. ව්‍යවසායකත්ව ක්‍රියාවලිය රූප සටහනකින් දක්වන්න. (ල. 2)

ii. රටක ආර්ථික සංවර්ධනය සඳහා ව්‍යවසායකත්වය අත්‍යවශ්‍ය සාධකයකි. පැහැදිලි කරන්න. (ල. 4)

iii. වර්තමානය වන විට ශ්‍රී ලාංකික කාන්තාවන් විවිධ ව්‍යාපාර ක්ෂේත්‍රයන් හි ව්‍යවසායකයින් ලෙස ඉදිරිපත් වී සිටිනු දැකිය හැකිය.

අ. කාන්තා ව්‍යවසායකත්වය ඉහළ යාමට හේතු 4 ක් ලියන්න. (ල. 2)

ආ. කාන්තා ව්‍යවසායකයින් නිරතව සිටින ව්‍යාපාර ක්ෂේත්‍ර 4 ක් දක්වන්න. (ල. 2)

iv. අ. ''රටක ආර්ථික වර්ධනයට කුඩා ව්‍යාපාරද ඉමහත් මෙහෙයක් සිදු කරයි.''
සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා දේශීයව හා ජාත්‍යන්තර වශයෙන් පිළිගෙන ඇති නිර්වචනයන් දක්වන්න. (ල. 2)
ආ. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ලක්ෂණ 4 ක් දක්වන්න. (ල. 2)
v. අ. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට බලාපොරොත්තු වන පුද්ගලයෙකු අවධානය යොමු කල යුතු කරුණු 4 ක් දක්වන්න. (ල. 2)
ආ. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන් පවත්වාගෙන යන අයෙකුට එම ව්‍යාපාරය සාර්ථක කර ගැනීමට බලපාන කරුණු 4 ක් දක්වන්න. (ල. 2)

06. i. පොදු පිළිගැනීම හොඳ මුදලක ගුණාංගයකි. ගනුදෙනුවේ දී පොදු පිළිගැනීමක් ඇති වීමට නම් මුදල් තවත් ගුණාංග කිහිපයකින් යුක්ත විය යුතුය.
අ. එවැනි ගුණාංග 4 ක් සඳහන් කරන්න. (ල. 2)
ආ. මහ බැංකුවේ ප්‍රධාන කාර්යයන් දෙක සඳහන් කරන්න. (ල. 2)
ii. ''ව්‍යාපාර වර්ධනය කිරීමෙහිලා වෙළඳපොළ අතරමැදියන් විශාල කාර්යභාරයක් සිදු කරයි.''
වෙළඳපොල අතරමැදියන් වන ආයෝජන කළමනාකරුවන් සහ ආන්තික සැපයුම්කරුවන් වෙන වෙනම හඳුන්වන්න. (ල. 4)
iii. බැංකුවල ආරම්භ කල හැකි විවිධ තැන්පත් ගිණුම් අතරින් ව්‍යාපාරිකයන්ට සුදුසු තැන්පත් ගිණුම් වර්ගය නම් කර එමගින් ලබා ගත හැකි පහසුකම් 4 ක් දක්වන්න. (ල. 4)
iv. අ. ''ඇතැම් පුද්ගලයින් ණය කාඩ්පත් භාවිතා කිරීමට මැලිකමක් දක්වයි.'' එයට හේතු පැහැදිලි කරන්න. (ල. 2)
ආ. බලපත්‍ර ලාභි වාණිජ බැංකුවලින් බලපත්‍රලාභි විශේෂිත බැංකු වෙනස් වන ආකාර 2 ක් දක්වන්න. (ල. 2)
v. විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් මගින් ව්‍යාපාරිකයන්ට අත්වන වාසි 4 ක් දක්වන්න. (ල. 4)

07. i. වර්තමානයේ රට පුරාම බේකරි නිෂ්පාදන හා බෙදාහැරීමේ ව්‍යාපාර ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙමින් පවතියි.
අ. මෙම ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශව දක්වන්න. (ල. 2)
ආ. ඉන් පාර්ශව 2 ක් කෙරෙහි ව්‍යාපාරය උනන්දුවක් දක්වන්නේ මන්දැයි පැහැදිලි කරන්න. (ල. 2)
ii. තොරතුරු තාක්ෂණයේ දියුණුවත් සමගම ව්‍යාපාර ක්ෂේත්‍රයේ සිදු වී ඇති ප්‍රවණතා 4 ක් දක්වන්න. (ල. 4)
iii. රටක ආර්ථික සංවර්ධනයට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ලබා දෙන දායකත්වය කරුණු 4 ක් පැහැදිලි කරන්න. (ල. 4)
iv. ශ්‍රී ලංකාව තුල කුඩා ව්‍යාපාර හඳුනා ගැනීමට ඉදිරිපත් කර ඇති ප්‍රමාණාත්මක නිර්ණායක පදනම් කරගෙන පහත ආයතන ඉදිරිපත් කර ඇති නිර්ණායක දක්වන්න.
අ. කාර්මික තාක්ෂණික ආයතනය
ආ. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව (ල. 4)
v. රාජ්‍ය පිස්කල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය පැහැදිලි කරන්න. (ල. 4)

08. i. ව්‍යාපාර විවිධ පදනම් යටතේ වර්ග කල හැකිය.
අ. එම පදනම් යටතේ ව්‍යාපාර වර්ග කර දක්වන්න. (ල. 2)
ආ. හවුල් ගිවිසුමක ඇතුලත් වන කරුණු 4 ක් දක්වන්න. (ල. 2)
ii. අ. ඒෂියා පැසිපික් සමාගම කුමන සමාගම් වර්ගයට අයත් වේ ද? (ල. 2)
ආ. ඇපයෙන් සීමිත සමාගමක ලක්ෂණ 2 ක් දක්වන්න. (ල. 2)
iii. 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ සඳහන් කරුණු 4 ක් දක්වන්න. (ල. 4)
iv. ශ්‍රී ලංකා ක්ලියර් (පුද්.) සමාගම විසින් ඉටු කරන නිෂ්කාශන සේවා 2 ක් සඳහන් කරන්න. (ල. 4)
v. වාණිජ බැංකු සපයන සේවාවන් 4 ක් සඳහන් කරන්න. (ල. 4)